DOI: 10.31357/fhssmst.2003.00049

ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
නුගේගොඩ

# ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලිය " රජරට සේවය "

*ලියාපදිංචි අංකය*

*GS / HU / 1206 / 2000*

*ඉදිරිපත් කිරීම*

ප්‍රදීප් හේමන්ත අබේකෝන්

# පිදුම !

අද අප අතර නොසිටියද අපගේ යහපත
සෑම නිමේෂයකදීම ප්‍රාර්ථනා කළ සහ
ඒ සඳහා සිය ජීවිතයම කැප කළ

**චිත්‍රා අබේකෝන්**

මාගේ මෑණියන් වෙත

භක්ත්‍යාදරයෙනි.

# පූර්විකාව

ගුවන්විදුලි මාධ්‍ය ක්ෂේත්‍රයේත් සන්නිවේදන ක්ෂේත්‍රයේත් මා ලද අත්දැකීම් එකට ගොනු කරන්නට නොනිමි ආශාවෙන් පසුවුනෙමි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව ඒ සිහිනය මල්වල ගන්වන්නට මාහට දායක විය.

ශ්‍රී ලංකා ගුවන්විදුලි ඉතිහාසයේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලිය ලෙස සැලකෙන "රජරට සේවය" පිළිබඳව කොතෙකුත් අදහස් අසා සහ කියවා තිබුනෙමි. 1996 වසරේ සිට 1999 දක්වා එහි ව්‍යාපාර කළමණාකරු ලෙස සේවය කරන්නට මාහට ලැබීම නිසා රජරට සේවයේ යථාර්ථය යම්තාක් දුරකට හෝ වටහා ගන්නට හැකියාව ලැබුනෙමි. විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ බැම් ලිහී නිම් වලලු පුළුල් වී ඇති මෙවන් යුගයක "රජරට සේවය" පිළිබඳව කෙරෙන විමර්ශණයක් ඉතා ප්‍රයෝජනවත් යැයි විශ්වාස කරමි. අතීත රජරට සේවයත් වත්මන් "රජරට එෆ්.එම්." විකාශයත් අතර පරතරය ඉතා පුළුල් ලෙස විමර්ශණය කළ යුත්තකි. මෙම නිබන්ධනය ඊට ප්‍රවේශයක් ලෙස පමණක් සළකන්වා !

498
යක්කඩුව
ජාඇල

☆ සැබෑ මනුෂ්‍යත්වයේ ගුණ සුවඳින් පිරිපුන් කලා ලොවේ ගෞරවණීය ආදරයට නිරතුරුවම බඳුන් වන **නෙල්සන් අබේකෝන්** මපියාණන්ට.

☆ සිප් සයුරින් එතෙර වන්නට නැණැස පාදාදුන් මාගේ දයාබර ගුරුතුමන්ලාට.

☆ තොරතුරු සම්පාදනයෙන් විශේෂ සහයෝගයක් ලබාදුන් රජරට එෆ්.එම්. හි ජ්‍යෙෂ්ඨ සංවිධායක **තෙන්නකෝන් ඉහළගම** මහතාට, ගිණුම් අංශ ප්‍රධානි **කරුණාරත්න අලහකෝන්** මහතාට, නිශ්පාදන කාර්යය මණ්ඩලයේ **ජීවේන්ද්‍ර ධර්මසිරි** සහ **පී.ආර්. පියසේන** යන සොහොයුරන්ට.

☆ මෙම නිබන්ධනය සැකසීමේදී විශේෂ සහයෝගයක් ලබාදුන් කොළඹ 02 සම්පත ප්‍රකාශකයෝහි කළමණාකාරිනි **සුසිලා පද්මිණී** මහත්මියටත්.

☆ නොයෙකුත් ඇනුම් - බැනුම්, උසුළු - විසුළු මධ්‍යයේ ඉතා සංයමයෙන් පරිඝනක තාක්ෂණය මඟින් මෙම නිබන්ධනයට විශේෂ ජීවයක් ලබාදුන් **ලංකනී** සොයුරියටත්,

☆ කාර්ය බහුල ජීවිතය මධ්‍යයේ වුවත් මෙවැනි අධ්‍යාපනික කාර්යයක් සඳහා කාලය සහ විවේකය ලබාදෙමින් මගේ පසුබිමෙහි සිට ධෛර්යය හා ශක්තිය ලබාදෙන දයාබර සුහදිනිය **නදීකා**ටත්.

*ස්තූතියි !*

# ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලිය " රජරට සේවය "

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි ඉතිහාසය. | 01 - 03 |
| 02. | ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලිය , රජරට සේවය , සහ එහි ඓතිහාසික ගමන්මග. | 04 - 05 |
| 03. | රජරට කලාපය සහ එහි භූගෝලීය පසුබිම. | 06 - 07 |
| 04. | රජරට ශ්‍රවණ කලාපය සහ එහි සංස්කෘතික අනන්‍යතාවය. | 08 - 10 |
| 05. | රජරට සේවයේ අමරණීය වැඩසටහන්. | 11 - 14 |
| 06. | රජරට නව පරපුරක පෙරගමන්කරුවෝ. | 15 - 19 |
| 07. | රජරට සේවය කලා ලොවට තිළිණ කළ ශිල්පි පරපුර. | 20 - 24 |
| 08. | රජරට සේවයේ සංයුතිය සහ පරිපාලන ව්‍යුහය. | 25 - 27 |
| 09. | රජරට සේවය , රජරට එෆ්.එම් , වූ වගයි. | 28 - 34 |
| 10. | ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලියේ අනාගතය. | 35 - 41 |
| | ආශ්‍රිත ග්‍රන්ථ සහ ප්‍රකාශණ නාමාවලිය. | 42 |

01

## 01 වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි ඉතිහාසය

දැනුම සහ විනෝදාස්වාදය සැනෙකින් ලබාදිය හැකි විද්‍යුත් මාධ්‍යයක් වන්නාවූ ගුවන් විදුලිය ශ්‍රව්‍ය මුඛ්‍ය මාධ්‍යයකි. දෘශ්‍ය මූලික සංජානනය තරම් ප්‍රබල නොවුනත් ග්‍රාහකයන් ආකර්ශණය කරගැනීමේ අපූර්ව බලයක් ගුවන් විදුලිය සතුය. " වැඩක යෙදෙන අතරතුර සවන් දීමට හැකියාව " (Listen while you work) මෙම මාධ්‍යයේ සුවිශේෂත්වයයි. සිදාදියේ සිට ඈත දුර බැහැර ගම්දොරවල් දක්වා ගුවන් විදුලිය ජන ජීවිතය හා බද්ධ වී තිබෙන්නේ ප්‍රධාන වශයෙන් මේ හේතුව පදනම් කරගෙනය.

1924 ජුනි 27 වන දින සිට " රේඩියෝ සිලෝන් " නමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ගුවන් විදුලි සේවය බිහි වේ. 1925 දෙසැම්බර් 16 වන දින සිට මෙම ආයතනය තව දුරටත් විධිමත්ව පවත්වාගෙන යනු ලැබීය. මෙම " රේඩියෝ සිලෝන් " සේවය එවකට පවත්වාගෙන යනු ලැබුවේ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව යටතේය.

1949 දී මෙය ගුවන් විදුලි දෙපාර්තමේන්තුව බවට පත්විය. 1966 අංක 37 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ මෙය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව බවට පරිවර්තනය විය. වර්තමානයේදී " ශ්‍රී ලංකා ගුවන් විදුලිය " ලෙස හැඳින්වූවත් නෛතික දෘෂ්ඨි කෝණයෙන් මෙය තවමත් රාජ්‍ය සංස්ථාවකි.

**<u>1966 අංක 37 දරණ ගුවන් විදුලි සංස්ථා පනත.</u>**

මෙය සකස් කර ඇත්තේ නවසීලන්ත ගුවන් විදුලි සංස්ථා ආකෘතිය පදනම් කරගෙනය. මෙහි සුවිශේෂත්වය වූයේ එතෙක් මෙරට අවධානය යොමු වී නොතිබුණු ගුවන් විදුලි වැඩසටහන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් මෙහි අන්තර්ගතව තිබීමය.

උක්ත පනතේ ප්‍රකාර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් විසුරුවා හරිනු ලබන වැඩසටහන් පහත අවශ්‍යතා සපුරාලිය යුතුයි.

(අ) වැඩසටහන් සංවර විය යුතුයි. වාර්ගික විරෝධී හෝ හැඟීම් අවුස්සන සුළු නොවිය යුතුයි.

(ආ) ගුණාත්මක භාවයෙන් හා වඩා සමතුලිත භාවයෙන් වැඩසටහන් පවත්වාගෙන යායුතුය.

(ඇ) ප්‍රවෘත්ති දැඩි නිරවද්‍යතාවයකින් හා අපක්ෂපාති ලෙස ඉදිරිපත් විය යුතුය.

මෙම පනතේ 03 වන වගන්තිය එම පනතේ කාර්යභාරය මෙසේ දක්වා තිබේ.

(අ) ශ්‍රී ලංකාව තුල ගුවන් විදුලි සේවයක් පවත්වාගෙනයාම සහ එය සංවර්ධනය කිරීම.

(ආ) ගුවන් විදුලි සංස්ථාව මගින් විසුරුවා හරින වැඩසටහන් අධීක්ෂණය.

(ඇ) ගුවන් විදුලිය ආශ්‍රිත කරුණු පිළිබඳව විෂයය භාර අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ඈ) පනතින් පැවරුණු සංස්ථාව වෙත පැවරෙන බලතල සහ රාජකාරි ඉටු කිරීම.

මෙම පනතේ තවත් වැදගත්ම ප්‍රතිපාදනයක් වනුයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හැරුණු විට පිහිටුවන වෙනත් ගුවන් විදුලි ආයතන පෞද්ගලික ඒවා ලෙස පිළිගැනීමත් එසේ පෞද්ගලික ගුවන් විදුලි ආයතන පිහිටුවීමට අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය අවශ්‍ය වීමත්ය. මෙම පනතේ 44 වන වගන්තියට අනුව ජනමාධ්‍ය භාර අමාත්‍යවරයාට ගුවන් විදුලි සංස්ථාවේ උපදෙස් මත පෞද්ගලික ගුවන් විදුලි ආයතනයක් හෝ සේවයක් ඇරඹීමට / පවත්වාගෙන යාමට සිය අවසරය ලබාදිය හැකියි.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සිය ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලිය " රජරට සේවය " නමින් 1979 අප්‍රේල් 12 වන දින ආරම්භ කරන ලදී. එය සමස්ථ ශ්‍රී ලාංකීය ගුවන් විදුලි ඉතිහාසයේම ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවය විය. පසු කලෙක රුහුණු සේවය (මාතර) සහ කඳුරට සේවය (මහනුවර) නමින් ප්‍රාදේශීය ගුවන් විදුලි ආයතනද යාපනය සහ වන්නි සේවාද ගිරාදුරුකෝට්ටේ, මහඉලුප්පල්ලම, කොත්මලේ සහ පුලතිසි රාවය ප්‍රජා ගුවන් විදුලි සේවාද අරඹනු ලැබිය. (1981 දී ශ්‍රී ලාංකික ආර්ථිකයේ ඇතිකළ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිය වූ මහවැලි ව්‍යාපාරය සහ ඒ ඔස්සේ ඇතිවූ සමාජ පෙරලිය තුලින් මහවැලි ප්‍රජා ගුවන් විදුලිය වශයෙන් ප්‍රජා ගුවන් විදුලි සේවා ඇරඹිනි. ක්‍රමයෙන් මහවැලි ප්‍රජා ගුවන් විදුලියේ ක්‍රමික විකාශයක් ලෙස කොත්මලේ ගිරාදුරුකෝට්ටේ සහ මහඉලුප්පල්ලම වශයෙන් ප්‍රජා ගුවන් විදුලි සේවා 03 කට බෙදී ගියේය. එයින් ඉක්බිතිව වර්ෂ 1998 දී "පුලතිසිරාවය" නමින් ශ්‍රී ලංකාවේ සිව්වන ප්‍රජා ගුවන් විදුලි සේවය ආරම්භ කරනු ලැබිය.)

මේ හැරුණු විට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් ගුවන්විදුලි සේවා ගණනාවක් පවත්වා ගනු ලැබේ.

- ස්වදේශීය සේවය - සිංහල
- වෙළඳ සේවය - සිංහල
  (2001.03.22 දින සිට " පවන " ගුවන් විදුලිය වශයෙන් නම වෙනස් කරනු ලැබීය. 2003 වර්ෂයේදී මෙය Info at Radio නමින්ද මහජන ගුවන් විදුලිය නමින්ද හඳුන්වනු ලැබීය. නුදුරු දිනෙක " City F.M. " වශයෙන් නම් කිරීමට නියමිතව ඇත.)
- වෙළඳ සේවය - ඉංග්‍රීසි
- වෙළඳ සේවය - දෙමළ
- ස්වදේශීය සේවය - දෙමළ
- මැද පෙරදිග සේවය (කෙටි තරංග ඔස්සෙ මැද පෙරදිග රටවලට විකාශය කෙරේ.)
- ජාතික ක්‍රීඩා විකාශය
  (2001.02.01 දින සිට මෙය නවතා ඇත. ප්‍රධාන පෙලේ ක්‍රීඩා තරංගවලදී පමණක් වානිජ පදනමක් යටතේ විකාශය කෙරේ.)
- " විසිර " සංස්කෘතික ගුවන් විදුලිය
  (ක්‍රීඩා විකාශය ගුවන් ගන්නා තරංග ඔස්සේම සීමිත කාල වේලාවක් තුල විකාශය කරනු ලැබීය. වර්තමානයේද මෙයද නතර කර ඇත.)

මින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ විශාලතම ගුවන් විදුලි ජාලය හිමිවන්නේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට බවය. අති ප්‍රබල ගුවන් විදුලි තරංගද පරිශීලනය කරන්නේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසිනි.

**<u>ශ්‍රී ලංකාවේ පෞද්ගලික ගුවන් විදුලි සේවා.</u>**

1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතට අනුව ගුවන් විදුලි විෂයය භාර අමාත්‍යවරයාට (වර්තමානයේදී නම් ජනමාධ්‍ය අමත්‍යවරයාට) පෞද්ගලික ගුවන් විදුලි සේවා ඇරඹීමට අවසර ලබා දිය හැකිවිය. මේ අනුව ප්‍රථම පෞද්ගලික ගුවන් විදුලි සේවය වූයේ කොළඹ කොමියුනිකේෂන් සමාගම මගින් පවත්වා ගෙන ගිය " එෆ්.එම්. 99 " නාලිකාවයි. (පසු කලෙක මෙය ' සවන ' නමින් නම්කරනු ලැබිය) වර්ෂ කීපයකට පසු අදාල සමාගම මෙය ඊ.ඒ.පී. නෙට්වර්ක් ආයතනයට අලෙවි කරනු ලැබිය. (වර්තමානයේදී ශ්‍රී එෆ්.එම්. නමින් පවත්වා ගෙන යනු ලබන්නේ මෙම නාලිකාවයි.)

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් විසුරුවා හරින ප්‍රධාන කාර්යාලයේ ගුවන් විදුලි සේවා, ප්‍රාදේශිය ගුවන් විදුලි සේවා, ප්‍රජා ගුවන් විදුලි සේවා හැරුණු විට මේ වන විට පවත්වා ගෙන යනු ලබන සෙසු ගුවන් විදුලි නාලිකා සහ මාධ්‍ය ආයතන පහත දක්වේ.

| | **<u>ගුවන් විදුලි නාලිකාව</u>** | **<u>ආයතනය</u>** |
|---|---|---|
| 1. | " ලක්හඬ " රේඩියෝ අයි.ටී.එන්. (සිංහල) | ස්වාධීන රූපවාහිනි සේවය. |
| 2. | " සිරස " එෆ්.එම් (සිංහල) | එම්.ටී.වී. පුද්ගලික සමාගම |
| 3. | " ඉයස් " එෆ්.එම්. (ඉංග්‍රීසි) | එම්.ටී.වී. පුද්ගලික සමාගම |
| 4. | " ශක්ති " එෆ්.එම්. (දෙමළ) | එම්.ටී.වී. පුද්ගලික සමාගම |
| 5. | " හිරු " එෆ්.එම්. (සිංහල) | ඒ.බී.සී. නෙට්වර්ක් පුද්ගලික සමාගම |
| 6. | " ෂා " එෆ්.එම්. (සිංහල) | ඒ.බී.සී. නෙට්වර්ක් පුද්ගලික සමාගම |
| 7. | " සන් " එෆ්.එම්. (ඉංග්‍රීසි) | ඒ.බී.සී. නෙට්වර්ක් පුද්ගලික සමාගම |
| 8. | " ගෝල්ඩ් " එෆ්.එම්. (ඉංග්‍රීසි) | ඒ.බී.සී. නෙට්වර්ක් පුද්ගලික සමාගම |
| 9. | " ශ්‍රී " එෆ්.එම්. (සිංහල) | සී/ස ඊ.ඒ.පී. නෙට් වර්ක් |
| 10. | " රජ " එෆ්.එම් (සිංහල) | සී/ස ඊ.ඒ.පී. නෙට් වර්ක් |
| 11. | " ඊ " එෆ්.එම්. (ඉංග්‍රීසි) | සී/ස ඊ.ඒ.පී. නෙට් වර්ක් |
| 12. | " ස්වර්ණ ඔළි " (දෙමළ) | සී/ස ඊ.ඒ.පී. නෙට් වර්ක් |
| 13. | " ඉසිර " එෆ්.එම්. (සිංහල) | සී/ස ටී.එන්.එල්. පුද්ගලික සමාගම |
| 14. | ලයිට් එෆ්.එම්. (ඉංග්‍රීසි) | සී/ස ටී.එන්.එල්. පුද්ගලික සමාගම |

ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි මාධ්‍යය ඉතිහාසයේ සිට වර්තමානය දක්වා විමසූ විට පැහැදිලි වන්නේ වර්තමානයේ එය අතිශයින්ම තරඟකාරී ක්ෂේත්‍රයක් බවට පත්ව ඇති බවයි. සම්පත් සහ යටිතල පහසුකම් වලින් දුර්මුඛ වූ " රජරට " වැනි ගුවන් විදුලි නාලිකාවක් මෙම උවැන්ත තරඟය අභිමුවෙහි අතිශයින්ම තීරණාත්මක සන්ධිස්ථානයකට එළඹ ඇත.

.............................

**02 වන පරිච්ඡේදය**

# ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලිය "රජරට සේවය " සහ එහි ඓතිහාසික ගමන් මඟ.

**දොරින් දොර සවස රඳනා**

**හදින් හද මිහිර විඳිනා**

**දිනෙන් දින නුවණ වඩනා**

**නිතින ඔබ සමඟ සිටිනා**

**" රජරට සේවය**

**ඔබ දිවි ගමනේ සුමිතුරු "**

උක්ත තේමාව පදනම් කර ගනිමින් ශ්‍රී ලාංකික ගුවන්විදුලි වංශ කථාවට නව ප්‍රවේශයක් සනිටුවහන් කරමින් වර්ෂ 1979 අප්‍රේල් මස 12 වන දින පෙරවරු 9.30 ට යෙදී තිබූ සුභ මොහොතින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලිය "රජරට සේවය" ආරම්භ විය. අනුරාධපුර ගුවන් තොටුපළ සමීපයෙහි පිහිටි ගුවන්විදුලි සංස්ථාවේ කි.හ. 774 මධ්‍යම තරංග (M.W.) සම්ප්‍රේශණාගාරයේ ඉතා කුඩා මැදිරියක සිට මෙම ඓතිහාසික අවස්ථාව ඇරඹිණි.

එවකට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයා වූ ඒමන් කාරියකරවන මහතාත් අධ්‍යක්ෂ ජනරාල් තේවිස් ගුරුගේ මහතාත් රජරට සේවයේ සමාරම්භක උත්සවයට සහභාගී වූහ. එවකට ගුවන් විදුලිය භාර අමාත්‍යවරයා වූයේ ආනන්ද තිස්ස ද අල්විස් මහතාය.

රජරට සේවයේ ප්‍රථම ප්‍රාදේශීය සේවා අධ්‍යක්ෂවරයා වූයේ සිරිල් රාජපක්ෂ මහතාය. විජයානන්ද ජයවීර, ස්වර්ණ ශ්‍රී බණ්ඩාර, ප්‍රේමකීර්තිද අල්විස්, සේන ගුණසේකර, සිරිපාල රදම්පලගමගේ, එම්.ජී. ජයසිංහ, සෝමසිරි චන්ද්‍රසේන, එඩ්වඩ් කුරුප්පුආරච්චි, සුනිල් විජේසිංහ, කුමුදු සෙනෙවිරත්න, හරිස්චන්ද්‍ර පෙරේරා යන මහත්ම මහත්මීන් වැඩසටහන් අංශයේද නිව්ටන් ගුණසේකර, කුලසේන ෆොන්සේකා, ඇන්තනි ජයමාන්න යන මහත්වරුන් ඇතුළු පිරිසක් ප්‍රවෘත්ති අංශයේද ආරම්භක කාර්යය මණ්ඩලය ලෙස කටයුතු කළහ.

එයින් ඉක්බිතිව වර්ෂ 02 කට පසුව 1981 දී රජරට සේවා කාර්යාලය අනුරාධපුර ගුවන් තොටුපළ සමීපයේ පිහිටි හරිස්චන්ද්‍ර මාවතේ සිට කඩපණහ පිහිටි වර්තමාන භූමි ප්‍රදේශයට ගෙනඑනු ලැබිය. අනුරාධපුරයේ සිට විකාශය වූ කි.හ. 774 මධ්‍යම තරංග සම්ප්‍රේශණය වෙනුවට මහවින් විකාශය වූ කි.හ. 801 මධ්‍යම තරංග සම්ප්‍රේශණය ඔස්සේ රජරට සේවා වැඩසටහන් ප්‍රචාරය ආරම්භ විය. මේ සමගම දැදුරුඔයෙන් ඔබ්බෙන් පිහිටි සත්කෝරළයටද රජරට සේවා වැඩසටහන් ප්‍රචාරක පරාසය පුළුල් විය.

රජරට සේවා ඉතිහාසය තුල තෙවැනි නව පිබිදීම ආරම්භ වූයේ 1984 ජනවාරි 24 වන දින සිටය. මෙදින කඩපණහ කාර්යාල භූමියේම නව මැදිරි සංකීර්ණය (වර්තමාන මැදිරි සංකීර්ණය) ආරම්භ වූවා පමණක් නොව මහව මධ්‍යම තරංග 801 වෙනුවට 639 ඔස්සේ විශාල ප්‍රදේශයකට වැඩසටහන් ප්‍රචාරය පුළුල් විය. ඉන්පසුව කරගහතැන්න 102.4 එෆ්.එම්. ඔස්සේද රජරට සේවය විසුරුවා හරිනු ලැබිය. (වර්තමානයේදීද රජරට සේවා වැඩසටහන් විකාශය වන්නේ මෙම ස්ටීරියෝ තරංග මාලාව ඔස්සේය.)

ගුවන්විදුලි ශ්‍රාවකයන්ගේ බුද්ධියට නිගා නොවන අයුරින් ඔවුනට උසස් රසවින්දනයක් ලබාදීමට රජරට සේවයේ වර්ෂ 24 ක ඉතිහාසය තුළ සාර්ථක ප්‍රයත්නයක් දරන ලදි. රජරට කලාපය පුරා විසිරී සිටින සහජ කලාකුසලතාවයන් උරුමකරගත් ගීත රචකයින්, ගායකයින්, සංගීතඥයින්, නාට්‍ය ශිල්පීන්, ලේඛකයින් ඇතුළු විශාල පිරිසකගේ හැකියාවන් ලෝකය වෙත විවර කිරීමට රජරට සේවය කළ මෙහෙය සත්‍ය වශයෙන්ම ප්‍රශංසනීය වේ. එය එසේ සිදු නොවුයේ නම් කැළයේ පිපුනු මල් කැළයේම පරවී යන්නා සේ මෙම රජරට මානව සම්පත ඔවුන්ගේ කුශලතාවයන් සමගම මුළු රටටම සහ ලෝකයටම අහිමි වී යාමට ඉඩ තිබුණි. මින් පැහැදිලි වන්නාවූ කරුණ වන්නේ රජරට සේවය තම ශ්‍රවණ කලාපයේ භූගෝලීය, සංස්කෘතික ලක්ෂණ පදනම් කරගත් වැඩසටහන් සම්පාදනය කරමින් ද කලාපීය ජන විඥාපනය සහ අනන්‍යතාවය හෙළිකරන වැඩසටහන් සහ ගීත ප්‍රචාරය කරමින්ද රජරට ශ්‍රාවකයන් වෙත සුවිශාල සේවාවක් සිදුකළ බවය. මේ අතරින් ගීත සාහිත්‍යයට සහ රසවින්දනයට රජරට සේවයෙන් ලැබුණු දායකත්වය අති සුවිශාලය.

රජරට සේවයේ ඓතිහාසික ගමන්මගේ නවතම සන්ධිස්ථානය වූයේ 2002 වර්ෂයේ සිට එහි නාමය " රජරට එෆ්.එම් " නමින් වෙනස් කරනු ලැබීමත්, ඊටම ගැළපෙන පරිදි වැඩසටහන් සංශෝධනයක් සිදු කිරීමත්ය. (මේ පිළිබඳව 09 වන පරිච්ඡේදයේ විස්තර කර ඇත.)

**රජරට සේවයේ අධ්‍යක්ෂකවරුන් සහ පාලකවරුන්.**

රජරට සේවයේ ඓතිහාසික ගමන්මග තුළ ඊට නායකත්වය සැපයූ අධ්‍යක්ෂකවරු / පාලකවරු 14 කි.

1. සිරිල් රාජපක්ෂ මහතා.
2. ශ්‍රීපාලි වයමන් මහතා.
3. හිල්ටන් පෙරේරා මහතා.
4. ජී.ටී. වික්‍රමසිංහ මහතා.
5. තිලක සුධර්මන්ද සිල්වා මහතා.
6. ඩී.එස්. දයාරත්න මහතා.
7. ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහතා.
8. විජයානන්ද ජයවීර මහතා.
9. ගුණදාස කපුගේ මහතා.
10. කිත්සිරි අළුත්ගේ මහතා.
11. කපිල රත්නායක මහතා.
12. නිව්ටන් ගුණසේකර මහතා.
13. ජෝතිපාල තෙබුවන මහතා.
14. සුනිල් විජේසිංහ මහතා.

මේ බොහෝ අධ්‍යක්ෂකවරු / පාලකවරු ශ්‍රී ලංකාවේ සාහිත්‍ය ක්ෂේත්‍රයේත්, සංගීත ක්ෂේත්‍රයේත් ප්‍රවීණයන් වීම සුවිශේෂත්වයකි. මේ බොහෝ මාධ්‍ය දැවැන්තයන් රජරට සේවයේ සැබෑ පෙරගමන්කරුවෝ විය. ඒ නිසාම රජරට සේවය ප්‍රාදේශීය සේවයක් වුවත් පසුගිය දශක 02 කට අධික කාලය තුළ ගුවන් විදුලි ක්ෂේත්‍රයේ පැහැදිලි අවධානයක් දිනාගැනීමට ඊට හැකිවිය.

.....................

## 03 වන පරිච්ඡේදය

# රජරට කලාපය සහ එහි භූගෝලීය පසුබිම.

ශ්‍රී ලංකාවේ මුල්ම ආර්යය ජනාවාසය ලෙස සැලකෙන අනුරාධපුරය කේන්ද්‍ර කරගත් රාජ්‍ය පාලන ප්‍රදේශය " රජරට " ලෙස හැඳින්වේ. මාංතොට, දඹකොළපටුන සහ ගෝකණ්න දක්වා විහිදී ගිය ප්‍රදේශය රජරටට අයත් භූමි ප්‍රදේශය ලෙස සැලකේ.

පුරාන පාරම්පරික දේවස්තෝත්‍ර වලින් කියවෙන පරිදි මින්නේරිය, දොලොස්දහව, නුවර කලාවිය (නුවර වැව, කලාවැව, පදවිය යන වැව් වලින් පෝෂිත ප්‍රදේශයයි.) පොලොන්නරුව තමන්කඩුව හා වන්නි හත්පත්තුවට අයත් කොටසද දඹුළු ලෙන ආශ්‍රිත මාතලේ සීමාවද රජරට ලෙස නම් කෙරීන. මෙම භූමි ප්‍රදේශය සලකා බැලූවිට පැහැදිලි වන්නේ " රජරට " ලෙස සැලකෙන ප්‍රදේශය ඉතා විශාල බවය.

පැරණි රජරට භූගෝලීය සීමාව දිස්ත්‍රික්ක වලින් දක්වනු ලැබේනම් එය පහත පරිදි වනු ඇත.

**<u>පැරණි , රජරට , භූගෝලීය සීමාව.</u>**

(1) අනුරාධපුරය දිස්ත්‍රික්කය.
(2) පොලොන්නරුව දිස්ත්‍රික්කය.
(3) මාතලේ දිස්ත්‍රික්කය.
(4) කුරුණෑගල දිස්ත්‍රික්කය.
(5) වව්නියාව දිස්ත්‍රික්කය.
(6) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.
(7) පුත්තලම දිස්ත්‍රික්කය.
(8) මන්නාරම් දිස්ත්‍රික්කය.
(9) මුලතිව් දිස්ත්‍රික්කය.
(10) යාපනය දිස්ත්‍රික්කය.

කෘෂි ආර්ථික රටාවක් කේන්ද්‍ර කරගත් රජරට ප්‍රදේශය වූ කලී විශාල භූමි ප්‍රදේශයකින් සමන්විත ඓතිහාසික වටිනාකමෙන් අනූන ප්‍රදේශයකි. ශ්‍රී ලංකාවේ දේශගුණික වශයෙන් බෙදා වෙන්කර ඇති ආකාරයට සැලකුවහොත් රජරට ප්‍රදේශයම වියලි කලාපයට අයත් වෙයි. මෙකී කලාපය තුල වර්ෂාපතනය ද්විත්ව රටාවකට ලැබීම නිසා වර්ෂාව ඇති කාල 02 ක් හා නියං කාල 02 ක් එක් වර්ෂයක් තුල දැකිය හැකිය. රජරට වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1500 ක් පමණ වේයැයි ගණන් බලා ඇති අතර ඉන් 70% ක ප්‍රමාණය ඔක්තෝම්බර් සිට ජනවාරි මැද දක්වා දිවෙන මාස් කන්නයේදී ලැබේ. අනෙක් වර්ෂා කාලය වන්නේ මාර්තු සිට මැයි මැද දක්වා වන යල කන්නයයි.

ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල වර්ෂාව අවම ප්‍රමාණයක් ලැබෙන බැවින් මෙම කාලසීමාව වර්ෂයේ වඩාත්ම වියලි කාලය ලෙස සැලකේ. මෙම තත්වය අද වන විට දේශගුණ විචල්‍යයන්ට භාජනය වී ඇති බවද පෙනේ.

කෘෂිකර්මාන්තය රජරට කලාපය සමග කොතෙක් බද්ධ වී ඇත්ද යන්න රජරට විටෙක " වැව් බැඳි රාජ්‍යය " ලෙස හැඳින්වීමෙන්ද පැහැදිලි වේ. මෙම රජරට කලාපයටම ආවේනික වූ " රජරට සේවය " ද ස්වකීය වැඩසටහන් සමුච්චයට කෙත, කමත හා සංයෝග වූ කෘෂි වැඩසටහන් රාශියක් තිලිණ කළේද රජරට කලාපයේ ජන හදගැස්ම හඳුනාගත් නිසාවෙන්මය. මේ සෑම වැඩසටහනකින්ම රජරට ගැමි ජීවන සුවඳ වහනය විය. මේ වැඩසටහන් හේතුකොටගෙන රජරට ජන ජීවිතයේ නව ප්‍රබෝධයක් ඇති විය.

උදා :- පිලේ පැදුර
ඉර හැංගෙන හෝරාව
කමත
(මෙවැනි ජනප්‍රසාදය ලැබූ වැඩසටහන් රාශියක් පිළිබඳව 05 වන පරිච්ඡේදයේ සවිස්තරව හඳුන්වා දී ඇත.)

ගැමි ජන හදවතේ හෘද ස්පන්දනය හොඳින් හඳුනාගත් මෙම වැඩසටහන් සාමාන්‍ය ගුවන් විදුලි වැඩසටහන් ආකෘතිය මත පිළියෙල නොවීම විශේෂත්වයකි. මේ සෑම වැඩසටහනකදීම ඊටම ආවේනික භාෂාවක් සහ සුවිශේෂ ඉදිරිපත් කිරීමක් දැකිය හැකිය. රජරට ප්‍රාදේශීය ගුවන් විදුලියේ විකාශය වුවද මේවා ජාතික තලයේ කතිකාවට භාජනය වූයේද මේවායේ නැවුම් බව නිසාමය.

රජරට කලාපය පුරා භවභෝග කර්මාන්තයේ නිරත වූ ගොවියන් හා ඔවුන්ගෙන් යැපෙන කණ්ඩායම් වැඩි වශයෙන් සිටින බැවින් උක්ත ඉලක්ක ශ්‍රාවක පිරිස කේන්ද්‍ර කරගත් වෙළඳ දැන්වීම් රාශියක් රජරට සේවය තුළින් ප්‍රචාරය වනු දැකිය හැකිය. සමස්ථයක් ලෙසට සලකා බැලූ විට රජරට සේවය ඉතා ඉඩි වෙළඳ දැන්වීම් හිඟයකට මුහුණදී තිබුනද තවමත් ප්‍රධාන කාර්යාලය හරහා මෙවැනි වෙළඳ දැන්වීම් ලැබෙනුයේ රජරට භූගෝලීය කලාපය සතු මෙම කෘෂි ජීවන රටාව හේතුවෙනි.

උදා : - පලිබෝධ නාශක දැන්වීම්
පොහොර දැන්වීම්
ගොවි විශ්‍රාම වැටුප් දැන්වීම්
මේ අතරින් ප්‍රධාන තැනක් ගනී.

......................

### 04 වන පරිච්ඡේදය

## රජරට ශ්‍රවණ කලාපය සහ එහි අනන්‍යතාවය

ශ්‍රී ලාංකික සංස්කෘතික පුනරුදයේ සමාරම්භක කේන්ද්‍රස්ථානය ලෙස සැලකෙන "රජරට කලාපය" සම්ප්‍රදායික කෘෂිකාර්මික ආර්ථිකයේ ඓතිහාසික කෙත්බිම වශයෙන්ද අවිවාදයෙන් සැලකේ. "වැව් බැඳි රාජ්‍යය" වශයෙන්ද හැඳින්වෙන අතීත ශ්‍රී විභූතිය විදහා දක්වන "රජරට" අදත් ජනතාවට බත සපයන මහා භූමිය ලෙස නම් දරයි.

මේ මහා භූමිය තුළ වාසය කළ අතීත මුතුන් මිත්තෝ ස්වයංපෝෂිත ආර්ථිකයකට හිමිකම් කීහ. එකිනෙකා පරයමින් තරඟකාරීව සිය ජීවන රටාව ජයගැනීම ඔවුන්ගේ අභිලාෂය නොවීය. බොහෝ දෙනෙකුට සිය ප්‍රාථමික අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ ගැටළුවක් නොතිබිණි. සිය භවභෝග කර්මාන්තයේ නියැලෙමින් අන් අයටද සහය වෙමින් සාමූහිකත්වය පදනම් කරගත් දිවිපෙවෙතක් ඔවුනොවුන්ගෙන් විද්‍යාමාන විය. දැඩි ආගමික භක්තියකින් වෙලී සිටි ඔවුහු "ගමයි පන්සලයි - වැවයි දාගැබයි" වශයෙන් සිය දිවි පෙවෙත සරසා ගති. (රජරට කලාපය තුළ වර්තමානයේද මෙම සංකල්පය මුළුමනින්ම වෙනස් වී නොමැත.)

පසු කලෙක රජරට ගොවි ජනතාව තරඟකාරී ලෝකය හමුවේ ආර්ථික, සමාජ හා සංස්කෘතිකමය වශයෙන් විවිධ වෙනස්වීම් වලට හා දුෂ්කරතාවලට මුහුණ දුනි. මෙම පීඩා කාරී තත්වයෙන් ඔවුන් මුදවා ගැනීමට නවීන ජනමාධ්‍යවලට විශාල වගකීමක් පැවරෙන බව අවිවාදිතය. මාධ්‍ය සතු වගකීම වන්නේ ජාතික සංවර්ධන ක්‍රියාවලියට උද්යෝගීමත් ජනතා සහභාගීත්වයෙන් ගොඩනැගෙන මනා දායකත්වයක් ලබාදීමයි. මෙකී අරමුණට ළඟාවීමේ ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් 1979 අප්‍රේල් 12 වන දින ගුවන් විදුලි ඉතිහාසයේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවය ලෙස "රජරට සේවය" ආරම්භ කරන ලදි.

අභිමානවත් රජරට ජන ජීවිතයට නැවුම් ප්‍රබෝධයක් ඇතිකරලීමේ අභිමතාර්ථය පෙරදැරිකරගත් රජරට සේවය ගම්බිම් කරා පිවිසියාය. ගැමි ජනතාවගේ සතුට ප්‍රීතිය අභිමුවෙහි මෙන්ම ඔවුන්ගේ අනේකවිධ දුක්ඛදෝමනස්සයන් අභිමුවෙහිද ගමේ සිටම කථා කළාය. ගොයම් කවිය, පැල් කවිය රජරට ජන ජීවිතය හා කොතරම් බැඳී පැවතියේද, එතරමටම ඒවා රජරට සේවයටද සමීප විය. රජරට ගැමියා සහ ගොවියා මෙම සොඳුරු මාධ්‍යය ස්වකීය හද ගැස්ම සේම ඔවුන්ගේ සංවාද මංඩපයක් ලෙසද සළකනු ලැබිය.

ජාතික ගුවන් විදුලිය සිය කෘෂිකාර්මික වැඩසටහන් නිශ්පාදනය කළේ නිලධාරීන් කේන්ද්‍ර කරගත් සම්ප්‍රදායකිනි. එහෙත් රජරට සේවය මෙම සම්මතය පුපුරුවා හරිමින් ගොවියාගේ සහභාගීත්වය ඇතිව සිය වැඩසටහන් නිශ්පාදනය කළේය. එවැනි වැඩසටහන් සැලසුම් කිරීමේ හා නිර්මානය කිරීමේ හැකියාව ඇති අති දක්ෂ නිර්මාණශීලි ශිල්පීන් පිරිසක් රජරට සේවය සතුවිය. බොහෝ විට එම පරපුර රජරට කලාපයෙන්ම බිහිවූ පිරිසක් වීම සුවිශේෂ විය. මෙහි ඵලය වූයේ රජරට සුවඳ වහනය වන ඔවුන්ගේ හද ගැස්ම දැනෙන හැඟෙන වැඩසටහන් රාශියක් රජරට සේවය තුලින් බිහිවීමයි. රජරට සේවය ඔස්සේ විකාශයවූ "පිලේ පැදුර", "තෝ තැන්න", "සංහිඳ", "කෘෂිරටා", "ඉර හැංගෙන හෝරාව" වැනි වැඩසටහන් මෙහි මහඟු ඵල විය.

ශ්‍රී ලංකාවේ බිහිවූ ප්‍රදේශීය ගුවන් විදුලි සේවාවන් අතර විශාල ශ්‍රවණ කලාපයක් ආවරණය කරන්නේ රජරට සේවයයි. එෆ්.එම්. 102.4 ඔස්සේ රජරට සේවයේ වැඩසටහන් විසුරුවා හරිනු ලබන්නේ කරගහතැන්න සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයයි. ප්‍රධාන වශයෙන් අනුරාධපුරය, පොලොන්නරුව, කුරුණෑගල, පුත්තලම, මාතලේ සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්ද අර්ධ වශයෙන් මන්නාරම, මඩකලපුව, වවුනියාව, අම්පාර, මහනුවර, කෑගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්කයන්ද මෙම පුළුල් ශ්‍රවණ කලාපයට අයත් වේ.

**<u>රජරට සේවයේ ශ්‍රවණ කලාපය.</u>**

1. අනුරාධපුරය දිස්ත්‍රික්කය.
2. කුරුණෑගල දිස්ත්‍රික්කය.
3. මාතලේ දිස්ත්‍රික්කය.
4. පොලොන්නරුව දිස්ත්‍රික්කය.
5. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.
6. වව්නියාව දිස්ත්‍රික්කය.
7. මන්නාරම දිස්ත්‍රික්කය.
8. පුත්තලම දිස්ත්‍රික්කය.
9. කෑගල්ල දිස්ත්‍රික්කය.
10. මහනුවර දිස්ත්‍රික්කය.
11. බදුල්ල දිස්ත්‍රික්කය.
12. මුලතිව් දිස්ත්‍රික්කය.
13. මඩකලපුව දිස්ත්‍රික්කය.
14. ගම්පහ දිස්ත්‍රික්කය.

වැව් බැඳි රාජ්‍යය තුල නැතහොත් රජරට කලාපයේ වැසියන් හට බොහෝ දුරට ඔවුන්ගේම බස් වහරක් මෙන්ම වාග් කෝෂයක් දැකිය හැකිය. රජරට සේවයේ ආරම්භයේ සිටම රජරට අනන්‍යතාවය විද්‍යාමාන කළ වැඩසටහන් සහ විවිත්‍රාංග වල බොහෝ දුරට මෙම බස් වහර භාවිතා කිරීමට ඒවායේ නිර්මාණකරුවන් සහ ඉදිරිපත් කරන්නන් උත්සාහ ගත් බව පෙනේ. රජරට වැසියන්ගේ භාවිතයේ පවතින එවන් වදන් සහ වැකි කීපයක් පහත දැක්වේ.

- උඹැහැ - ඔබ / නුඹ.
- උඹැහැත්තා - ඔබ / නුඹ (මිත්‍රශීලී ආමන්ත්‍රණය)
- උන්නැහැ - එතුමා (ගෞරවශීලී ආමන්ත්‍රණය)
- අපුච්චා - තාත්තා, අප්පච්චි
- අපේ හුරා - මස්සිනා
- ඉසව්ව - දිශාව / ප්‍රදේශය

- ✷ හප්පේ ! - පුදුමය දනවන සුළු (අම්මේ !)
- ✷ ඔත්පොළ - අසනීප වීම / නැගිටින්න බැරිව එක්තැන් වීම
- ✷ මහ ගෑණි / මහ එකී - ගෙදර ස්වාමියා බිරිඳට කියයි.
- ✷ විචිකිච්චාව - ලැජ්ජාශීලීව / සැකයෙන්.
- ✷ ගොම්මන් වේලාව - සවස් යාමයේ - ඉර බැසීමට ආසන්න (ගොන් මහට බසින වේලාව)
- ✷ අලියම් වේලාව - අලි මහට බසින වේලාව (රාත්‍රී 9 - 10 පමණ වේලාව)
- ✷ ලොකු කොල්ලා - ලොකු පුතා
- ✷ පුංචි කොල්ලා - පොඩි පුතා
- ✷ පැටියා - දරුවා / ළමයා
- ✷ සුනංගු - පරක්කු
- ✷ දෙසා බානවා - බැන්නා
- ✷ දෙසා බෑවා - බැන වැදුනා
- ✷ කුරු අඩිය - අමුත්තන්ට කෑම දීමට මෙහි උඩ තබයි. (බුලත් තට්ටුව වැනි ලී කෝටුවලින් සෑදූ එකකි.)
- ✷ වරමන්ද - කුළු හරක් අල්ලන්නා භාවිතා කරනා සත්ව හම් වලින් සාදා ගන්නා උගුලකි.
- ✷ හක්කලං කරනවා - සැරිසරනවා.
- ✷ කළුවර දෙයියෝ වඩිනවා - කළුවරේ යාම
- ✷ නොසන්ඩාල - හික්මුනු නැති - නැහැදිච්ච
- ✷ උප්පරවැට්ටිය - කපටි කමින් කරන උපක්‍රමය
- ✷ අන්දමන්ද - වික්ෂිප්තව

මේ බොහෝ වදන් රජරට කලාපය පුරා වර්තමානයේදීද භාවිතා වේ. එසේම මෙම වදන් රජරට කලාපයෙන් පිටතද භාවිතා වනු ඇතැම් අවස්ථාවල දකිය හැකිය. රජරට ප්‍රදේශයේ සිට සෙසු ප්‍රදේශ වලට සංක්‍රමණය වූ පිරිස් නිසා එය සිදුව ඇතැයි සැලකිය හැකිය.

..................